**නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය - 2018**

**------------------------------------------------------------------**

නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්-පී 98 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4.08 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ අවබෝධතා ගිවිසුමට අනුව, මුදල් අමාත්‍යාංශයේ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් පාලන ප්‍රදේශවල කුඩා හා ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම නැගෙනහිර පළාත් සභාව සතු අතර ජල සැපයුම් පහසුකම් පුළුල් කිරීම හා ඉදි කිරීම මගින් ආරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා මහා පරිමාණ නල ජල සැපයීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතුවේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 7,703 කට සමාන ජපන් යෙන් මිලියන 6,054 ක් වූ අතර ඉන් රු.මිලියන 6,239 කට සමාන ජපන් යෙන් මිලියන 4,904 ක් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් ලබාදීමට එකඟ වී තිබුණි. තවද, රු.මිලියන 6,527 කට සමාන ජපන් යෙන් මිලියන 5,130 ක් අම්පාර දිස්ත්‍රික් ජල සැපයුම් ව්‍යාපෘතියට වෙන් කර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 5,267 කට සමාන ජපන් යෙන් මිලියන 4,140 ක් මූල්‍යනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය කටයුතු කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ජූලි මස ආරම්භ කරන ලද අතර 2013 දෙසැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලය 2018 ජනවාරි 23 දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතියේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) 2017 දෙසැම්බර් 31 දින දක්වා ගෙවන ලද රු.මිලියන 656.60 ක් වූ එකතු කිරීමේ අගය මත බදු ශ්‍රී ලංකා රජයෙන් ලත් දායකයට එරෙහිව හිලව් කර තිබුණි. | රජයේ දායකත්වය අවප්‍රමාණ වේ. | පරිවයක් ලෙස එකතු කිරීමේ අගය මත බදු ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන අර මුදල්වලට එරෙහිව හිලව් කළ හැක. | ශ්‍රී ලංකා රජයෙන් ලත් මුළු දායකය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) 2016 දෙසැම්බර් 31 දින දක්වා ණය නියෝජිතායතනය විසින් අයකර ගන්නා ලද රු.මිලියන 91.45 ක් වූ පොළී ගාස්තු හා රු.මිලියන 25.47 ක් වූ බැඳීම් ගාස්තු ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | කෙරීගෙන යන වැඩ වටිනාකම අවප්‍රමාණය වේ. | පොළී ගෙවීම හා බැඳීම් ගාස්තු මහා භාණ්ඩාගාරයේ පොත්වල වාර්තා කරන බැවින් එම ගෙවීම්වල වගකීම ඔවුන් සතු වේ. | සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘතියේ මුළු උපයෝජනය නිරූපණය වන පරිදි අදාල පිරිවැය ගිණුම් ගත කළ යුතුයි. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ කාර්යන්වල භෞතික ප්‍රගතිය**

| විස්තරය | 2018 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය | | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | අපේක්ෂිත කිලෝමීටර් | ළඟා කර ගත් කිලෝමීටර | | | |
| කොණ්ඩවටුන සිට කල්මුණේ දක්වා නල එලීම් | 28 | 25 | ව්‍යාපෘතියේ අරමුණ ළඟා කර නොහැක. | මාර්ග සංවර්ධන අධිකාරියේ අවශ්‍යතාව මත නල එලීම් වෙනස් කිරීම නිසා කි.මීටර 3 ක හිඟයක් ඇති විය. | ණයට ගත් අරමුදල් කාර්යක්ෂම උපයෝජනය සහතික කිරීම පිණිස මුල් අදියරේ දී අවශ්‍යතාවයන් හඳුනා ගත යුතුය. |
| මහ ඔය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 80 | 48 | | අදහස් දක්වා නොමැත. | |
| දෙහි අත්තකණ්ඩිය ජල සම්පාදන යෝජනා ක්‍රමය | 78 | 68 | | සැලසුම් අදියරට පෙර ජාතික ජල | |

| | | | |
|---|---|---|---|
| | | සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු මඟින් වැඩ වලින් කොටසක් නිම කර තිබුණි. | |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| රු.මිලියන 253.83 ක් දරා නිම කරන ලද අම්පාර දිස්ත්‍රික්යේ පානම ජල යෝජනා ක්‍රමය ජල මූලාශ්‍රයක් නොමැතිකමින් 2016 සැප්තැම්බර් 30 දින සිට නිශ්කාර්යව පවතී. | රු.මිලියන 253.83 ක් වූ ඉදි කිරීම් වියදම නිෂ්ප්‍රයෝජන වී තිබුණි. | එකඟ වේ. වියළි කාලයේදී ජල පිරිපහදු පිරියතේ හිඟතාවයන් උද්ගත වන බැවින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඒ සඳහා විකල්ප මූලාශ්‍ර සොයමින් සිටී. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායන විසින් අයෝජිත අරමුදල්වල කාර්යක්ෂම උපයෝජනය සහතික වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 මතභේදයට තුඩු දෙන කරුණු**

| විගණන නිරීක්ෂණ | බලපෑම් | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) ඉදි කිරීම්වල ඉතිරි කටයුතු නිම කිරීමේ පිරිවැය පියවීම සඳහා 2016 ජුනි 15 දින ණය අවසන් වූ පසු රු.මිලියන 751.40 ක් කොන්ත්‍රාත්කරුවන් 03 ගේ පෞද්ගලික ගිණුම්වල මාරු කර තිබූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, කොන්ත්‍රාත්කරු විසින් මූලික අදියරේ තීරණය වූ විෂය පථයට අදාල ඉදි කිරීම් කාර්යන්ට පරිබාහිර කාර්යයන් සිදු කර තිබුණි. තවද, ගෙවීම් වාර්තා සමඟ මාසික බැංකු ප්‍රකාශන කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියට ලබා දී නොතිබුණි. | මෙහි පවතින පාලන දුර්වලතාව නිසා කොන්ත්‍රාත්කරු විසින් අරමුදල් අවභාවිතා කළ හැක. | ණය කාලය ඉක්මවීම නිසා මෙම අරමුදල් බැංකු ගිණුම්වලට මාරු කරන ලදී. විෂය පථයට අනුව සියලුම කොන්ත්‍රාත් කටයුතු ඉටු කරන ලදී. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යටතේ බැංකු ගිණුම් අධික්ෂණය වන බැවින් මාසික බැංකු ප්‍රකාශන අවශ්‍ය නොවේ. | අපතේ යාම හා අවභාවිතය වැලැක්වීම සඳහා ව්‍යාපෘති කටයුතු මෙහෙයුම් යන්ත්‍රය ශක්තිමත් කල යුතුය. |
| (ආ) 2010 ජුනි 28 දිනැති ව්‍යාපෘති අවබෝධතා ගිවිසුම අනුව ශ්‍රී ලංකා රජයේ දායකත්වය ලෙස රු.මිලියන 990 ක් පමණක් ව්‍යාපෘතියට වෙන් කර | ශ්‍රී ලංකා රජයට අමතර පීඩනයක් දැරීමට සිදුවිය | ව්‍යාපෘති ඇස්තමේන්තුව වසර 02 ට පෙර සකස් කර තිබූ අතර 2017 | එම |

| | | | |
|---|---|---|---|
| තිබුණි. කෙසේ වුව ද, ශ්‍රී ලංකා රජයට අතිරේක පිරිවැයක් ඇති කරමින් ව්‍යාපෘති පිරිවැය ඉහළ නැග තිබූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු.මිලියන 1,281.52 ක් වී තිබුණි. | හැක. | වර්ෂයේ නිම කරන ලදී. ඒ අනුව භාණ්ඩාගාර වෙන් කිරීම සංශෝධනය කරන ලදී. | |

**3.4 පද්ධති හා පාලන**

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 842 හි අවශ්‍යතාවයන්ට අනුව, ව්‍යාපෘතිය විසින් යාවත්කාලීන කල ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | වත්කම් අවභාවිතයට ඉඩ ඇති අතර ව්‍යාපෘතිය අවසානයේ වත්කම් භාරදීමේදී ගැටළුවලට මුහුණ පෑ හැක. | එකඟ වේ. ව්‍යාපෘතිය සඳහා තොග ලේඛනයක් නඩත්තු කිරීමට උපදෙස් ලැබී ඇත. | ව්‍යාපෘතිය විසින් මිලට ගත් වත්කම් හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනය යාවත් කාලීන කළ යුතුය. |